# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/30 - 2016 සැප්තැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) අනුව්‍යවස්ථාව යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මා හට පැවරී ඇති පහත උපලේඛනයේ කාර්යයන් 2016.08.23 වැනි දින සිට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යවරයාට පවරන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) අනුව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින.
කොළඹ 05,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 01. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 01. මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව<br>02. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 01. කම්කරු වන්දි ආඥාපනත (1934 අංක 19) |
| 02. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | |
| 03. ජාතික මිනිස් බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | | |
| 04. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | |
| 05. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයයන්ට අදාළ කටයුතු. | | |
| 06. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම. | | |

09 - 656